# විශ්වවිද්‍යාල ප්‍රවේශය කෙරෙහි පෞද්ගලික උපකාරක පන්තිවල බලපෑම

ඒ'. ඒ. එම්. මධුසංඛා[1], එම්. ඩී. එම්. උබේසේන[2], එල්. එල්. ආර්. ලොරෙන්සුහේවා[3], යූ. පී. පී. එස්. සමරනායක[4] සහ එච්. ටී. ඒ. එස්. හපුආරච්චි[5]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන විභාග රටාව තුළ පවත්වනු ලබන තරගකාරී මෙන් ම අභියෝගාත්මක විභාගය වන්නේ, අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයයි. මෙම තරගකාරීත්වය ජය ගෙන සරසවි වරම් ලබා ගැනීම උදෙසා සිසුන් විසින්, විවිධ ක්‍රම අනුගමනය කරයි. ඒ අනුව, සිසුන් ප්‍රධාන වශයෙන් මෙම විභාගය සමත් වීම කෙරෙහි උපකාරක පන්ති ප්‍රයෝජනයට ගනියි.

පෞද්ගලික උපකාරක පන්ති වලට සහභාගි වීම සහ විශ්වවිද්‍යාල ප්‍රවේශය අතර පවතින සම්බන්ධතාවය හඳුනාගැනීම සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ දෙවන වසර විද්‍යාර්ථීන් අතරින් ඒකක 105 ක නියැදියක් සමාජ විද්‍යා, මානව ශාස්ත්‍ර, වාණිජ සහ කළමණාකරණ හා විද්‍යා පීඨ වලින් ස්තෘත සසම්භාවී නියැදුම් ක්‍රමය යොදා ගනිමින් තෝරාගන්නා ලදී. ව්‍යුහගත ප්‍රශ්නාවලියක් මඟින් රැස්කර ගන්නා ලද ප්‍රාථමික දත්ත සහ වෙනත් ද්විතියික දත්ත මූලාශ්‍ර මඟින් ලබා ගන්නා ලද දත්ත විශ්ලේෂණයට ලක් කිරීමේ දී විශ්වවිද්‍යාල ප්‍රවේශ සහ පෞද්ගලික උපකාරක පන්ති අතර ධන සම්බන්ධයක් ඇති බව තහවුරු විය.

**මුඛ්‍ය පද** : අ.පො.ස උසස් පෙළ විභාගය, උපකාරක පන්ති, විශ්වවිද්‍යාලය ප්‍රවේශය, තරගකාරීත්වය

## හැඳින්වීම

වර්තමාන ලෝකයේ සෑම රටක් ම අධ්‍යාපනයට ප්‍රමුඛස්ථානයක් ලබා දෙයි. එම නිසා අධ්‍යාපනය වර්තමානයේ වඩා තරගකාරී ස්වරූපයක් ගනියි. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය දෙස බලන කල, විභාග පදනම් කරගත් අධ්‍යාපන රටාවක් ක්‍රියාත්මක වන අතර එමඟින් අ.පො.ස (උ.පෙළ)

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය දෙවන වසර, amarasinghe92@gmail.com

[2] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය දෙවන වසර, madusanka57ubesena@gmail.com

[3] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය දෙවන වසර, rangani22lorensuhewa@gmail.com

[4] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය දෙවන වසර, prabodhasubha@gmail.com

[5] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය දෙවන වසර, ashanshalika008@gmail.com

විභාගය වඩාත් තරගකාරී කඩඉම් විභාගයක් බවට පත් ව තිබේ. මක් නිසා ද කිවහොත් අපේක්ෂකයන් ලක්ෂ 2-3 ක් අතර ප්‍රමාණයකින් විශ්වවිද්‍යාලය සඳහා ඇතුලත් කර ගනු ලබන්නේ, 20000-25000 තරම් සුළු පිරිසකි (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව, 2013). මේ නිසා සිසුන් බහුතරයක් විශ්වවිද්‍යාල කඩඉම් ලකුණු ලබා ගැනීම උදෙසා දැඩි කැපවීමකින් යුක්තව තම අධ්‍යයන කටයුතු වල නිරත වෙයි.

### ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ආරම්භය සහ විකාශය

ශ්‍රී ලංකාවේ රාජධානි සමයන් හි පන්සල් මුල් කරගත් අධ්‍යාපන රටාවක් පැවති අතර එය පසුකාලීන ව පිරිවෙන් දක්වා විකාශය වූ බවට සාධක පවතියි. ක්‍රි.ව.1505 දී පෘතුගීසීන් හා ක්‍රි.ව.1602 දී ලන්දේසීන් පැමිණීමෙන් පසු අධ්‍යාපනය විවිධාංගීකරණයන්ගෙන් යුක්ත විය. ක්‍රි.ව.1796 දී ඉංග්‍රීසීන්ගේ ආගමනය ත් සමග ලංකාවේ අධ්‍යාපන රටාව වෙනස් විය (අධ්‍යාපන අමාත්‍යංශය, 1999).

ශ්‍රී ලංකාව යටත් විජිත පාලනයට නතුව තිබූ සමයක් වුව ද, 1931 බ්‍රිතාන්‍ය ජාතිකයන් ක්‍රියාත්මක කළඩොනමෝර් ප්‍රතිසංස්කරණය තුළ සර්ව ජන ඡන්ද බලය ශ්‍රී ලංකාවට හිමි විය. ඒ සමඟම රාජ්‍ය මන්ත්‍රණ සභා ක්‍රමයේ විධායක කමිටුවේ අධ්‍යාපන ඇමති ධූරයට සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා පත් විය. ඒ අනුව එතුමා විසින් නිදහස් අධ්‍යාපනය සමස්ත රට තුළ ම ක්‍රියාවට නැංවීමෙ හි ලා අරගලයක නිරත විය. එහි ප්‍රතිඵලයත් සමඟ ම ශ්‍රී ලංකාවට නිදහස ලබා ගැනීමට වසර තුනක ට පෙරාතුව එනම් 1945 දී සැමට අධ්‍යාපනය ලැබීමේ සම වරප්‍රසාදය හිමි විය (උඩුගම, 2003).

නිදහස් අධ්‍යාපනයත් සමඟ අධ්‍යාපන රටාවේ වර්ධනයක් ඇති විය. ශ්‍රී ලංකාව 1948 දී බ්‍රිතාන්‍යයන්ගෙන් නිදහස් වූ දින සිට 2007 කාල සීමාව දක්වා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රාශියක් සිදු වූ අතර වර්තමානයේ ක්‍රියාත්මක වන්නේ 2007 අධ්‍යාපන ප්‍රතිසංස්කරණයයි. මෙම අධ්‍යාපන ක්‍රමය තුළ ඉහළ අධ්‍යාපනයක් ලබා සිටින දෙමව්පියන් තම දරුවන්ට ඉහළ අධ්‍යාපනයක් ලබා දීම සඳහා අවශ්‍ය පහසුකම් ලබා දෙනු ලැබේ. ඒ යටතේ ඔවුන් විසින් තම දරුවන් හට අමතර දැනුම ලබා දීම සඳහා උපකාරක පන්ති කෙරෙහි යොමු කරනු ලබයි. මේ හේතුවෙන් ග්‍රාමීය ප්‍රදේශ වල ජීවත් වන දුප්පත් දරුවන් ද ඔවුන්ගේ දෙමාපියන් විසින් දැඩි අසීරුතාවයකින් යුක්තව වුවද උපකාරක පන්ති කෙරෙහි යොමු කරවනු ලබයි.

නාගරික මෙන්ම ග්‍රාමීය ප්‍රදේශ වල සිසුන් ද උපකාරක පන්ති කෙරෙහි යොමු වීමට ප්‍රධාන හේතු ලෙස,

1. තරඟකාරිත්වය

2. දෙමව්පියන්ගේ දැනුම හිඟකම මෙන්ම අවබෝධයක් නොතිබීම.

3. කාර්යක්ෂම ගුරුවරුන් හිඟකම.

4. අධ්‍යාපනය දුර්වල, මන්දගාමී සිසුන් කෙරෙහි අවධානය යොමු නොකිරීම.

5. විෂය නිර්දේශය දීර්ඝ වීම නිසා , පාසල් කාලය තුළ උගන්වා එය ආවරණය කළනොහැකි වීම.

6. ගුරුවරුන් හා සිසුන්ගේ සන්නිවේදනයේ පරතරය දුරස් වීම.


දැක්විය හැක (ෆොන්සේකා, 2007) . මීට අමතර ව උපකාරක පන්ති තුළින් උසස් පෙළ විභාගය ඉලක්ක කර ගනිමින් ලබා දෙන නිබන්ධන හා ප්‍රශ්න පත්‍ර නිසා බොහොමයක් සිසුන් ඒ කරා ඇදී යාමේ ප්‍රවණතාවයක් දක්නට ලැබෙයි.

**ක්‍රමවේදය**

කැලණිය විශ්වවිද්‍යාලයේ දෙවන වසර විද්‍යාර්ථීන් අතරින් ඒකක 105 ක නියැදියක් සමාජ විද්‍යා, මානව ශාස්ත්‍ර, වාණිජ සහ කළමණාකරණ හා විද්‍යා පීඨ වලින් ස්තෘත සසම්භාවී නියදුම් ක්‍රමය යොදා ගනිමින් තෝරාගන්නා ලදී. ව්‍යුහගත ප්‍රශ්නාවලියක් මඟින් ප්‍රාථමික දත්ත රැස්කර ගන්නා ලද අතර වෙනත් ද්විතියික දත්ත මූලාශ්‍ර මඟින් ද දත්ත රැස් කිරීම සිදු විය.

**දත්ත විශ්ලේෂණය**

රූපය 01: අධ්‍යයන පීඨයන් අනුව නියැදි ඒකකයන්ගේ ව්‍යාප්තිය




මූලාශ්‍රය: කර්තෘ නිර්මාණ


වගුව 01: පීඨය අනුව නියැදියට ඇතුළත් වූ සිසුන් ගණන

| | විද්‍යා | වාණිජ සහ කලමණාකරණ | මානව ශාස්ත්‍ර | සමාජයීය විද්‍යා |
|---|---|---|---|---|
| පිරිමි | 08 | 17 | 11 | 09 |
| ගැහැණු | 09 | 11 | 12 | 28 |

මූලාශ්‍රය: කර්තෘ නිර්මාණ

සියලුම පීඨ වලින් 5% බැගින් නියැදිය ලබා ගන්නා ලදී. ඒ අනුව විද්‍යා පීඨයෙන් පිරිමි ළමුන් 8 දෙනෙකු ත්, ගැහැණු ළමුන් 9 දෙනෙකු ත්, වාණිජ හා කලමනාකරණ පීඨයෙන් පිරිමි ළමුන් 17 දෙනෙකු ත්, ගැහැණු ළමුන් 11 දෙනෙකු ත්, මානව ශාස්ත්‍ර පීඨයෙන් පිරිමි ළමුන් 11 දෙනෙකු ත්, ගැහැණු ළමුන් 12 දෙනෙකු ත්, සමාජයීය විද්‍යා පීඨයෙන් පිරිමි ළමුන් 09 දෙනෙකු ත්, ගැහැණු ළමුන් 28 දෙනෙකු ත් සසම්භාවී ලෙස තෝරා ගන්නා ලදී.

ප්‍රස්තාරය 01: පාසැල් වර්ගය අනුව පෞද්ගලික උපකාරක පන්ති සඳහා සහභාගී වීම




මූලාශ්‍රය: කර්තෘ නිර්මාණ

සිසුන් උසස් පෙළ විෂය ධාරාව සඳහා තෝරා ගන්නා ලද පාසල් වර්ගය හා උපකාරක පන්ති සඳහා සහ එනම් පාසල් වර්ගයන් වන ජාතික, පළාත්, පිරිවෙන් හා පෞද්ගලික ගත් විට ජාතික පාසල්වල සිසුන් 72.38% ක් ද පළාත් පාසල්වල සිසුන් 25.71% ක් ද පිරිවෙන් හා පෞද්ගලික පාසල්වල සිසුන් 0.95% ක් ද උපකාරක පන්ති සඳහා සහභාගී වූ ප්‍රතිශතය දැක්විය හැකි ය.

**අධ්‍යයන පීඨ අනුව උපකාරක පන්ති වලට සහභාගිවීමේ ප්‍රවණතාවය**


මේ සඳහා පර්යේෂකයා තෝරා ගත් නියැදියට අනුව විශ්වවිද්‍යාලයේ පීඨ අනුව එනම් සමාජ විද්‍යා, මානව ශාස්ත්‍ර, වාණිජ සහ කලමණාකරණ හා විද්‍යා පීඨ අනුව උපකාරක පන්ති උපකාර වී ඇති පීඨය සෙවීමට සමීක්ෂණ දත්ත ඇසුරින් කටයුතු කරන ලදී.

වගුව 02: අධ්‍යයන පීඨ අනුව උපකාරක පන්ති වලට සහභාගිවීමේ ප්‍රවණතාවය

| පීඨය | උපකාරක පන්ති සහභාගීත්වය | |
|---|---|---|
| | සහභාගී වීම | සහභාගී නොවීම |
| සමාජ විද්‍යා | 94.59% | 05.41% |
| මානව ශාස්ත්‍ර | 82.61% | 17.39% |
| විද්‍යා | 100 % | - |
| වාණිජ සහ කළමණාකරණ | 92.86% | 07.14% |
| සමස්ත ප්‍රතිශතය | 93.33% | 06.66% |

මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය, 2015

ප්‍රස්තාරය 02: පීඨය හා උපකාරක පන්ති අතර ඇති සම්බන්ධය




මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය, 2015

සමීක්ෂණ දත්ත අනුව විද්‍යා පීඨයේ උපකාරක පන්ති සඳහා සහභාගීත්වය 100% බව ද, සමාජයීය විද්‍යා පීඨයේ උපකාරක පන්ති සඳහා සහභාගීත්වය 94.59% ක් ද, සහභාගී නොවීම 5.41% ක් වශයෙන් ද, මානව ශාස්ත්‍ර පීඨයේ උපකාරක පන්ති සඳහා සහභාගීත්වය 82.61% ක් ද, සහභාගී නොවීම 17.39% ක් වශයෙන් ද හා වාණිජ පීඨයේ උපකාරක පන්ති සහභාගීත්වය

92.86% ක් ද, සහභාගී නොවීම 7.14% ක් ද ප්‍රස්තාර අංක 2 අනුව පෙනී යයි.

**විශ්වවිද්‍යාලයට ප්‍රවේශය සහ පෞද්ගලික උපකාරක පන්තිවලට සහභාගිවීම අතර සම්බන්ධතාව බලපෑම**

පර්යේෂකයා ලබා ගත් දත්ත විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම වන, සහසම්බන්ධය, සරල ප්‍රතිපායනය මඟින් විශ්ලේෂණය කරනු ලැබී ය.

**සමාජීය විද්‍යා පීඨය**

පහත සඳහන් සූත්‍රය ට අනුව මාසික ආදායම සහ උපකාරක පන්ති සඳහා ගිය මාසික වියදම අතර කාල්පියර්සන්ගේ සහසම්බන්ධතා සංගුණකය ගණනය කරනු ලැබී ය.

$$r = \frac{n\sum xy - \sum x \sum y}{\sqrt{(n\sum x^2 - (\sum x)^2)(n\sum y^2 - (\sum y)^2)}}$$

මෙහි මාසික ආදායම සහ උපකාරක පන්ති සඳහා වැය වුණු මාසික වියදම අතර ගණනය කරන ලද සහසම්බන්ධතා සංගුණකයේ අගය 0.42 වේ. ඒ අනුව ඇත්තේ සාමාන්‍ය ධන සහසම්බන්ධයකි.

එමෙන් ම සරල ප්‍රතිපායනය ද භාවිත කරනු ලැබී ය. මෙහි $\beta_1$ හි සම්මත දෝෂය (S ($\beta_1$)) = 0.0047 ලෙස ද $\alpha = 0.01$ වෙසෙසියා මට්ටම යටතේ $\beta_1$ හි අනුක්‍රමණය වෙසෙසි ද යි පරීක්ෂා කරන ලදී. මෙහි ගණනය කළz අගය 2.13 වන අතර වගු අගය වන්නේ 2.58 ($\alpha = 0.01$ යටතේ) කි. ඒ අනුව වගු අගය (z අගය) ප්‍රතික්ෂේප ප්‍රදේශයට වැටේ. ඒ නිසා $\beta_1 = 0$ ශුන්‍ය කල්පිතය ප්‍රතික්ෂේප වේ. ඉන් අදහස් වන්නේ සංගහණ ප්‍රතිපායනයෙහි අනුක්‍රමණය ($\beta_1$) $\alpha = 0.01$ මට්ටමේ දී ශුන්‍යයෙන් වෙනස් වන බවයි. මෙහිදී $\beta_1 = 0$ කල්පිතය ප්‍රතික්ෂේප වන නිසා මාසික ආදායම සහ උපකාරක පන්ති සඳහා ගිය මාසික වියදම අතර සම්බන්ධයක් ඇති බව තහවුරු වේ.

වගුව 03: විචලතා විශ්ලේෂණය

| විචලන ප්‍රභවය | වර්ග ඓක්‍යය | සුවලන අංකය | වර්ග මධ්‍යන්‍යය | F අනුපාතය | F වගුව |
|---|---|---|---|---|---|
| Xi (SSR) | 2.42 | 1 | 2.42 | 4.75 | 4.17 ($\alpha = 0.05$) |
| දෝෂය (SSE) | 15.91 | 31 | 0.51 | | |
| මුළු (SST) | 18.33 | 32 | | | |

මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය, 2015

**මානව ශාස්ත්‍ර පීඨය**

පහත සඳහන් සූත්‍රයට අනුව මාසික ආදායම සහ උපකාරක පන්ති සඳහා වැය වුණු මාසික වියදම අතර කාල්පියර්සන්ගේ සහසම්බන්ධතා සංගුණකය මගින් ගණනය කරනු ලැබී ය.

$$r = \frac{n\sum xy - \sum x \sum y}{\sqrt{(n\sum x^2 - (\sum x)^2)(n\sum y^2 - (\sum y)^2)}}$$

මෙහි මාසික ආදායම සහ උපකාරක පන්ති සඳහා වැය වුණු මාසික වියදම අතර ගණනය කරන ලද සහසම්බන්ධතා සංගුණකයේ අගය 0.226 වේ. ඒ අනුව ඇත්තේ, ධන සහසම්බන්ධයකි.

එමෙන්ම සරල ප්‍රතිපායනය ද භාවිත කරනු ලැබී ය. මෙහි $\beta_1$ හි සම්මත දෝෂය (S ( $\beta_1$)) = 0.0083 ලෙස ද $\alpha = 0.01$ වෙසෙසියා මට්ටම යටතේ $\beta_1$ හි අනුක්‍රමණය වෙසෙසි ද යි පරීක්ෂා කරන ලදී. මෙහි ගණනය කළz අගය 2.048 වන අතර වගු අගය වන්නේ 1.729 ($\alpha = 0.1$ යටතේ) කි. ඒ අනුව වගු අගය (z අගය) ප්‍රතික්ෂේප ප්‍රදේශයට වැටේ. ඒ නිසා $\beta_1 = 0$ ශූන්‍ය කල්පිතය පිළිගැනෙයි. මින් අදහස් වන්නේ සංග්‍රහණ ප්‍රතිපායනයෙහි අනුක්‍රමණය ($\beta_1$) $\alpha = 0.1$ මට්ටමේ දී ශූන්‍යයෙන් වෙනස් නොවන බවයි. මේ අනුව මාසික ආදායම සහ උපකාරක පන්ති සඳහා වැය වුණු මාසික වියදම අතර සම්බන්ධයක් නැති බව තහවුරු වේ.

වගුව 04: විචලතා විශ්ලේෂණය

| විචලන ප්‍රභවය | වර්ග ඓක්‍යය | සුචලන අංකය | වර්ග මධ්‍යන්‍ය | F අනුපාතය | F වගුව |
|---|---|---|---|---|---|
| Xi (SSR) | 3.65 | 1 | 3.65 | 1.04 | 2.99 |
| දෝෂය (SSE) | 67.06 | 19 | 3.5 | | |
| මුළු (SST) | 70.01 | 20 | | | |

මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය, 2015

**විද්‍යා පීඨය**

පහත සඳහන් සූත්‍රයට අනුව මාසික ආදායම සහ උපකාරක පන්ති සඳහා වැය වුණු මාසික වියදම අතර කාල්පියර්සන්ගේ සහසම්බන්ධතා සංගුණකය ගණනය කරනු ලැබී ය.

$$r = \frac{n\sum xy - \sum x \sum y}{\sqrt{(n\sum x^2 - (\sum x)^2)(n\sum y^2 - (\sum y)^2)}}$$

මෙහි මාසික ආදායම සහ උපකාරක පන්ති සඳහා වැය වුණු මාසික වියදම අතර ගණනය කරන ලද සහසම්බන්ධතා සංගුණකයේ අගය 0.44 වේ. ඒ අනුව ඇත්තේ සාමාන්‍ය ධන සහසම්බන්ධයකි.

එමෙන් ම සරල ප්‍රතිපායනය ද භාවිත කරනු ලැබී ය. මෙහි $\beta_1$ සම්මත දෝෂය $s(\beta_1)=0.02$ ලෙස ද $\alpha$ =0.01 වෙසෙසි මට්ටම යටතේ $\beta_1$ හි අනුක්‍රමණය වෙසෙසි දැයි පරීක්ෂා කරන ලදී. මෙහි ගණනය කළt අගය 1.5 වන අතර වගු අගය වන්නේ ($\alpha$ =0.01) යටතේ 1.833 කි. ඒ අනුව වගු අගය ප්‍රතික්ෂේපිත ප්‍රදේශයට අයත් වෙයි. ඒ නිසා $\beta_1 = 0$ යන ශූන්‍ය කල්පිතය ප්‍රතික්ෂේප වේ. මින් අදහස් වන්නේ සංගහණ ප්‍රතිපායනයෙහි අනුක්‍රමණය ($\beta_1$) $\alpha$ =0.01 මට්ටමේ දී ශූන්‍යයෙන් වෙනස් වන බවයි. මේ අනුව මාසික ආදායම සහ උපකාරක පන්ති සඳහා වැය වුණු මාසික වියදම අතර සම්බන්ධයක් ඇති බව දැක්විය හැකි ය.

වගුව 05: විචලතා විශ්ලේෂණය

| විචලන ප්‍රභවය | වර්ග ඓක්‍යය | සුවලන අංකය | වර්ග මධ්‍යනය | F අනුපාතය | Fවගුව |
|---|---|---|---|---|---|
| Xi (SSR) | 13.61 | 1 | 13.61 | 1.95 | 3.36 |
| දෝෂය (SSE) | 62.83 | 9 | 6.98 | | |
| මුළු (SST) | 76.44 | 10 | | | |

මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය, 2015

**වාණිජ සහ කලමණාකරණ පීඨය**

පහත සඳහන් සූත්‍රයට අනුව මාසික ආදායම සහ උපකාරක පන්ති සඳහා වැය වුණු මාසික වියදම අතර කාල්පියර්සන්ගේ සහසම්බන්ධතා සංගුණකය ගණනය කරනු ලැබී ය.

$$r = \frac{n\sum xy - \sum x \sum y}{\sqrt{(n\sum x^2 - (\sum x)^2)(n\sum y^2 - (\sum y)^2)}}$$

මෙහි මාසික ආදායම සහ උපකාරක පන්ති සඳහා ගිය මාසික වියදම අතර ගණනය කරන ලද සහසම්බන්ධතා සංගුණකයේ අගය 0.6 වේ. ඒ අනුව ඇත්තේ සාමාන්‍ය ධන සහසම්බන්ධයකි.

එමෙන් ම සරල ප්‍රතිපායනය ද භාවිත කරනු ලැබී ය. මෙහි $\beta_1$ සම්මත දෝෂය $s(\beta_1)=3.09$ ලෙස ද $\alpha$ =0.01 වෙසෙසි මට්ටම යටතේ $\beta_1$ හි අනුක්‍රමණය වෙසෙසි දැයි පරීක්ෂා කරන ලදී. මෙහි ගණනය කළ t අගය -0.0097 වන අතර වගු අගය වන්නේ ($\alpha$ =0.01) යටතේ 1.717 කි. ඒ අනුව වගු අගය ප්‍රතික්ෂේපිත ප්‍රදේශයට අයත් වෙයි. ඒ නිසා $\beta_1 = 0$ යන ශුන්‍ය කල්පිතය ප්‍රතික්ෂේප වේ. මින් අදහස් වන්නේ සංගහණ ප්‍රතිපායනයෙහි අනුක්‍රමණය ($\beta_1$) $\alpha$ =0.01 මට්ටමේ දී ශුන්‍යයෙන් වෙනස් වන බවයි. මේ අනුව මාසික ආදායම සහ උපකාරක පන්ති සඳහා ගිය මාසික වියදම අතර සම්බන්ධයක් ඇති බව දැක්විය හැකි ය.

වගුව 06: විචලතා විශ්ලේෂණය

| විචලන ප්‍රභවය | වර්ග ඓක්‍යය | සුවලන අංකය | වර්ග මධ්‍යනය | F අනුපාතය | Fවගුව |
|---|---|---|---|---|---|
| Xi (SSR) | 38.47 | 1 | 38.47 | 11.65 | 2.93 |
| දෝෂය (SSE) | 72.5 | 22 | 3.3 | | |
| මුළු (SST) | 110,97 | 23 | | | |

මූලාශ්‍රයː නියැදි සමීක්ෂණය, 2015

**සමාලෝචනය**

මෙම තොරතුරු අනුව නිගමනය කළහැක්කේ, උපකාරක පන්ති සඳහා බහුතරයක් සහභාගී වන්නේ ජාතික පාසල්වල සිසුන් බව ය. සමස්තයක් වශයෙන් ගත් කළවිද්‍යා විෂයන් හැදෑරූ සිසුන් වැඩි ප්‍රමාණයක් අනෙකුත් විෂය ධාරාවන්ට සාපේක්ෂව උපකාරක පන්ති සඳහා සහභාගී වී ඇති බව දැක්විය හැකි විය. මීට අමතරව උපකාරක පන්ති සඳහා සහභාගී වීම සඳහා පවුලේ ආර්ථික තත්ත්වය හේතු වූ බව පර්යේෂණය තුළින් පෙනී ගිය කරුණකි. තව ද උපකාරක පන්ති සඳහා සහභාගී වීමට බලපෑ හේතු ලෙස පාසැල මඟින් ලබා දෙන විෂය දැනුම ප්‍රමාණවත් නොවීම, විෂය නිර්දේශය ආවරණය කිරීමට නොහැකි වීම, නිබන්ධන හා පුනරීක්ෂණ නොකිරීම, සමහර විෂයන්ට ගුරුවරුන් හිඟකම, පාසල් ගුරුවරුන් විසින් ම උපකාරක පන්ති සිදු කිරීම, විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඇති තරගකාරීත්වය ආදී හේතු සඳහන් කළහැක. එම හේතුන් අතුරින් ප්‍රධාන හේතුවක් ලෙස උපකාරක පන්ති පවත්වන ගුරුවරයාගේ අනිකුත් වසරවල පැවති ප්‍රතිඵල ප්‍රධානත ම හේතුව බව ගුණාත්මක දත්ත ඇසුරින් අනාවරණය කර ගත හැක. ඊට අමතරව දෙවන හා තෙවන හේතූන් ලෙස මවගේ සහ පවුලේ අයගේ කැමැත්ත සහ යහළුවන් සහභාගී වීම දැක්විය හැකි ය. සියලු කරුණු සලකා බැලීමෙන් උසස් පෙළ විභාගයෙන් වැඩි ප්‍රතිශතයක් උපකාරක පන්ති සඳහා සහභාගී වන බව සංඛ්‍යාත්මක දත්ත ඇසුරෙන් සනාථ කළ හැකි ය. එනම් විසි එක්වන සියවසේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා උපකාරක පන්ති අත්‍යවශ්‍ය වේ යන උපන්‍යාසය මෙමඟින් තහවුරු වේ.

මෙම පර්යේෂණයට අනුව යෝජනා කළ හැක්කේ පාසල් අධ්‍යාපනය මෙන්ම උපකාරක පන්ති විධිමත් ලෙස ප්‍රමිතිකරණය කළයුතු බව ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


අධ්‍යාපන අමාත්‍යංශය (1999). *ශ්‍රී ලංකාවේ ඉතිහාසය (4-කොටස).* කොළඹ: රජයේ මුද්‍රණාලය

උඩගම, පී. (2003) නිදහසින් පසු ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය. කොට්ටාව: සාර ප්‍රකාශන.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව (2013). *2012/2013 අධ්‍යයන වර්ෂ ශිෂ්‍ය අත්පොත.* කොළඹ: රජයේ මුද්‍රණාලය.

මොරගොඩ, එම්. (2014, ජනවාරි 17). ජාත්‍යන්තරය ඉලක්ක විය යුතු අධ්‍යාපන ක්‍රමයේ නව ප්‍රවණතා. උපුටා ගන්නා ලද්දේ 2015, අගෝස්තු 22, Sannasa.org/online sinhala news paper.

සිල්වා, පී. එච්. එම්. (2014). අ.පො.ස (සා.පෙළ) සිසුන්ගේ අධ්‍යයන කුසලතා සඳහා සාධක බලපෑම. *සමාජ සංඛ්‍යානය ශාස්ත්‍රීය සංග්‍රහය.* 1 (1). කැලණිය: කැලණිය විශ්වවිද්‍යාලය.

Kannangara, L. (2011). Private tuition boon or bane. *Sunday Observer*. July 17.

Suraweera, A.V. (2011) *Why students go for tuition*. Maharagama: National institute of Education.